ෆරාඉල් (අල් කුර්ආනයේ නියම කර ඇති දේපළ කොටස්) සඳහා හිමිකම් ඇති අයට ඒවා ලැබෙන්නට සළස්වන්න. ඉන්පසු ඉතිරි වන දේ මියගිය පුද්ගලයාගේ සමීපතම පිරිමි ඥාතියාට හිමි විය යුතුය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "ෆරාඉල් (අල් කුර්ආනයේ නියම කර ඇති දේපළ කොටස්) සඳහා හිමිකම් ඇති අයට ඒවා ලැබෙන්නට සළස්වන්න. ඉන්පසු ඉතිරි වන දේ මියගිය පුද්ගලයාගේ සමීපතම පිරිමි ඥාතියාට හිමි විය යුතුය" [صحيح] [متفق عليه]

මිය ගිය ඇත්තන් හැර දමා ගිය වස්තුව බෙදන්නන් හට ඒවා අල්ලාහ් අභිමත කර ඇති පරිදි නිත්යානුකූල සාධාරණනීය ක්රමයට අනුව වෙන් කර අදාළ උදවිය වෙත බෙදා දෙන මෙන් ද ඒවා නියම කර ඇති තැනැත්තන් හට අල්ලාහ්ගේ ග්රන්ථයේ සඳහන්ව ඇති ආකාරයට පිරිනමන මෙන් ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කර ඇත්තාහ. එනම් තුනෙන් කොටස් දෙකක්, තුනෙන් එක් කොටසක්, හයෙන් එක් කොටසක්, අඩක්, හතරෙන් එක් කොටසක් හා අටෙන් එක් කොටසක් යනාදී ලෙසිනි. ඉන්පසු ඉතිරිවන දෑ මියගිය තැනැත්තාට සමීපතම පිරිමි ඥාතියා හට පිරිනැමිය යුතුය. එයට අසබා යනුවෙන් නම් කෙරී ඇත.

https://sunnah.global/hadeeth/si/show/5887